පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 (දෙසැම්බර් 2017)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016 (December 2017)

**SINHALA I ( SLG 1 )**
**( ප්‍රබන්ධ කථා හා නාට්‍ය කලාව )**

**කාලය පැය තුනයි (03).**

සෑම කොටසකින්ම **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (09) නවයකි.

---

## I කොටස

1. "**විරාගයෙහි** අරවින්ද වත්මන් සමාජ සංදර්භයෙහි එන සැපයම ආත්මකොට ගත් සුඛපරමවාදයට (Hedonism) විරුද්ධව ක්‍රියා කළ අයෙකි." විමසන්න.

2. **විරාගයේ** අරවින්දගේ ආධ්‍යාත්මික නැඹුරුව හේතුවෙන් ඇති වූ මනෝමය ව්‍යසනය පිළිබඳ සාකච්ඡා කරන්න.

3. "ෆ්ලෝබියාගේ **එමා බොවාරි** නවකතාව, සෘණාත්මක පෞරුෂ සහිත පුද්ගලයන් විෂයෙහි උපදෙස් දීමේදී එම උපදේශකයා විසින් අධ්‍යයනය කරනු ලැබිය යුතුය." අදහස් දක්වන්න.

## I I කොටස

4. ස්ත්‍රී පුරුෂ සබඳතාවල යථාර්ථය පිළිබඳව ඩී එච් ලෝරන්ස් දැක්වූ අදහස් **රතු රෝස මල** කෘතියෙහි නිරූපණය වන්නේ කෙසේදැයි විමසන්න.

5. "ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතියේ සංක්‍රාන්තික අවධියක් **ජීවන සුවඳින්** නියෝජනය වෙයි." විමර්ශනය කරන්න.

6. "ඉච්ඡා භංගත්වය පුද්ගලයන් තුළ උග්‍ර කලකිරීමක් ඇති කරයි" යන්න කවබත යසුනරිගේ කෙටිකතා කිහිපයක් ඇසුරින් සාකච්ඡා කරන්න.

## I I I කොටස

7. "හෙන්රික් ඉබ්සන්ගේ **සෙල්ලම්ගෙය,** නවීන සමාජයේ පවුල යන ආයතනයෙහි දෙදරා යාම පිළිබඳ ආරම්භක අවස්ථාව සනිටුහන් කරයි." අදහස් දක්වන්න.

(අනෙක් පිට බලන්න)

8. "මතුපිටින් ප්‍රියශීලී පුද්ගලයෝ තීරණාත්මක අවස්ථාවලදී අවිශ්වසනීය වෙති. එසේම මතුපිටින් කාංසාවෙන් යුත් පුද්ගලයෝ තීරණාත්මක අවස්ථාවලදී උදාර වෙති." **මැට් කරත්තය** නාට්‍යය ඇසුරින් විමසන්න.

9. "මනුෂ්‍ය සම්බන්ධතා දෙස බාහිර සමාජය හෙළන දෘෂ්ටිය නිසා සංවේදී ස්ත්‍රී පුරුෂයෝ අකාලයේ වැනසෙති." **පෙමතො ජායතී සොකො** නාට්‍යය ඇසුරින් මේ කියමන පරීක්ෂා කරන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

CDCE

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 (දෙසැම්බර් 2017)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016 (December 2017)

# SINHALA II ( SLG 2 )

( පැරණි ගද්‍ය සාහිත්‍යය, භාෂාව හා ව්‍යාකරණය)

**කාලය පැය තුනයි (03).**

**පළමුවන** හා **නවවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

II, III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගත යුතු ය. මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව නවයකි (09).

---

## I කොටස

1. (අ) පහත දැක්වෙන **පාඨ තුන (03)** ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 10+8+7=25)

(ආ) ඉරි ඇඳි පද අතුරින් **පහකට (05)** විවරණ සපයන්න.

(ලකුණු 3×5 = 15)

(i)

එකල්හි දිවසරන් බඳු සතලිස්දහසක් නළුවෝ සවබරණින් සැදී පසඟතුරු ගෙන මහපුරිසා පිරිවරා සිට නැටුම්ගඳවු පැවත්වූහු. එකෙණෙහි මහබෝසතාණෝ නිදන්නට වන්හ. ඔවුන් නිදන සේ දකැ නළුවෝ තමන් තමන්[4] ගත් පසඟතුරුයෙහි වැතිර හෙවැ නිදන්නට වන්හු. එකල්හි මහබෝසතාණෝ පිබිද යහන්මත්තේ පලක් බැඳ වැඩහුන්නාහු ගඳතෙල දිලියෙන පහනින් තිදි ගත් මාගමුන් නැහැ හඩවනුවන් මියෙන් වැහෙන කෙළින් තෙත්සිරුරු ඇතියවුන් දත් කනුවන් කස්නවුන් වලප්නවුන් වළකට ඇතියවුන් නොමුවහ රහස්පියෙස් ඇතියවුන් දුගඳවා විහිදුනවුන් දකැ සංවේග කොට ශක්‍රභවනයක් බඳු මහල්තලය අමුසොහොනක් සේ වටහා ගිය කල්හි මුළු තුන්ලෙව් ගිනි ගත් ගෙකක් සේ දකැ අද මා පැවිජි වන්නට ගිය මැනැවැයි යහනින් නැඟී ගොස් හිණිගෙයි හොත් [සන්][5] මහඇමැත්තා පොබයාගෙන අසකු සදගෙනැ එනු කොට අස්සලට තබා යවූහු. හේ ගොස් දිලියෙන පහන් ඇති සමන්මල්වියන් යට රමණී බිම්පියෙස[6] සිටි කත්[7] නම් අස්රජහු දකැ ඉතා කැකුළු කොට සදන්ට පටන් ගත්. එසඳ අස් අද මහිමි මහභිනික්මන් කටැටි බඳයි සතුටු වැ මහත් කොට කුල්නට වනැ. පැතිරැ ගිය ඒ හඩ දෙවියෝ කිසි කෙනකුන් නොඇසිය දුන්හු.

බෝසතාණෝ රාල්කුමරුවන් දකැ පහයින් බැසැ අශ්වයා කරා එළඹැ මේ රැ තෝ මා තරවා. මම් මුළුලෝ තරවමී නැඟී අස්පිට වැඩ හුන්හු. ඒ අස් දිග අටළොස්හතැ.[8] දිගට සුදුසු උස ඇතියේ ය. බල ඇත්තේ ය. ජව ඇත්තේ ය. සුද. උහු කුල්නා හඩ හෝ ඇක්මෙන හඩ හෝ මුළුනුවර පැතිර යන බියෙන් දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් කුල්නා හඩ නොපැවැත්ත දුන්හ. ඇක්මෙන ඇක්මෙන පියවරට අත් දිගු කොට අත්ලෙහි ඇක්මවා ගත්හු.

(**අමාවතුර**: ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සංස: 14 පිටුව)

(අනෙක් පිට බලන්න.)

ii.

එ වේලෙහි සවාමිදරුවෝ පූර්වදිග්බලා ලංකානමැති අඞ්ගනාව තමන් වහන්සේට පෙරමඟ බලා, කර නඟා සිටියාක් වැනි වූ, මුදුන් කුළු නමැති කෙශ කලාපයෙකින් හා පෙර මීට දෙවාරයක් වැඩ මට පාද ස්පර්ශය නුදුන් සේකැ යි ශෝකයෙන් හඬන කඳුළු ධාරා දෙකක් වැනි මහවැලි ගඟ හා කැළණි ගඟ වැනි ගඞ්ගා යුග්මයකින් හා තව ද: පාදවියෝගයෙන් බෙද ව ඇය විසින් කඩා ඉස්නා ලද රත්නාභරණ සමූහයන් සේ වනය සිසාරා පිහිටි සියදහස් රත්නාකර සමූහයෙන් හා ශ්‍රීමත්ව දිලියෙන සමනොලකුළ දැක "අද මම ද පෙර බුදුන්ගේ සිරිත් කොට ලඞ්කාඞ්ගනාව සතුටු කරවමි"යි සිතා දිව්‍යනාග-ගන්ධර්වාදී පූජා විඳ විඳ පන්සියයක් මහ රහතන් හා සමඟ ආකාශයෙන් වැඩ පර්වතයමුදුනෙහි සනරන්කඳක්සේ දිලිහිදිලිහී වැඩසිටිසේක. එකෙණෙහි පර්වතය වෙවුලා මුදුන් කුළ ආකාශයට නැඟී බුදුන්ගේ ශ්‍රීපාදය පිළිගෙන අහසින් බැස පෙර සේම පිහිටා ගිය. ඉක්බිත්තෙන් සවාමිදරුවෝ මුරු-බඹ කැලන් කරන මහ පූජා විඳ විඳ පැළදිග බලා වැඩසිට මේ ශ්‍රී ලංකාද්වීප නමැති තුනුරුවන් භාණ්ඩාගාරය තමන් වහන්සේට හිමිනියාවටම හසක් එබුවා සේ, අටතුරා සියක් මඟුල් ලකුණෙන් ශ්‍රීමත් වූ දෙව්බඹුන්ට මුදුන් මල්කඩ වූ, එක් වියන් එක් වියත් තව අඟුලක් පමණ අයම් විතර ඇති වාම ශ්‍රීපාදය සලක්ෂණ කොට ඔබා වදළ සේක.

(**පූජාවලිය**: කිරිඇල්ලේ ඤාණවිමල සංස්: 755 පිටුව )

iii.

එකල දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි සුවාසූදහසක් රාජධානිවල සහ ඔවුනු පළන් සුවාසූදහසක් රජදරුවෝ තමතමන්ගේ සිවුරඟසෙන් පිරිවරා අවුත් උපස්ථාන කොට යෙති. හිමත් ගිමත්[2] වසන්[3] යන තුන් සෘතුවට සුදුසු තුන් මාළිගාවෙක් විය. එයින් එක් මාළිගායෙක්[4] මහාකප්පින නම් වෙයි. එකෙක් මොරගීව නම් වෙයි. එකෙක් මඞගල නම් වෙයි. ඒ තුන් මාළිගාවෙහි නොයෙක් දහස් ගණන් නළුනාටකයන් පිරිවරා කලින් කල වෙසෙති. පළමු පින් කරන ජාතියෙහි පසේබුදුන්ට මී පිළ දැක්වූ සත්‍රීතොමෝ එකල්හි රජකුලෙහි ඉපද දෙවඟනක් මෙන් දිලිහෙන රූපශ්‍රී ඇති ව සොළොස් දහසක් බිසෝවරුන්ට නායක ව අසන්ධිමිත්‍රා නම් වූ අග්‍රමහිෂිකා වූව. ඒ බිසොවුන්ගේ වනාහි කෙසානතයෙහි පටන් පාදනතය දක්වා අසො තෙනෙක සන්ධියෙක් ඇතැයි දනගත නොහැක්ක. ජාම්බොනද[5] කනකයෙන් මවාලූ රුවක් වැනියහ. ඔහු සැහැවී තිබෙන සන්ධි ඇති හෙයින් අසන්ධිමිත්‍රා නම් වෙති. තව ද රජ්ජුරුවන් ඔවුනු[6] පැළඳීම හා සමඟ නොයෙක් රාජ සෘඩි පහළ විය. දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි අණසක පැතිර ඉතිරෙමින් අහසින් යොදනෙක පොළොවින් යොදනෙක එකහෙළා ආඥව පවත්නේය. හිමවත අනවතත්ත නම් මහවිලින් සොළොස්කළයක් පැන් අටකදෙකින් දවස්පතා දෙවියෝ රජහට ගෙනවුත් දෙති. එම හිමාලයෙන් ඉතා සිනිඳු වූ මොළොක් වූ රසවත් වූ නාලිය දැහැටි දවස් පතා දෙවියෝ ගෙනවුත් දෙති. එසේ ම දෙවියෝ දිව්‍යමය වූ බෙහෙත් ඇඹුල ද දිව්‍යමය වූ අරළු ද වර්ණගන්ධ රසයෙන් යුක්ත වූ මහදියකළ පමණ රන්වන් අඹ ද[7] හිමාලයෙන් ගෙනවුත් දෙති.

(**සද්ධර්මාලංකාරය** : ප්‍රාචීන භාෂොපකාර සමාගමඃ 306 පිටුව )

(අනෙක් පිට බලන්න.)

## II කොටස

2. සිද්ධි හා අවස්ථා නිරූපණයෙහිලා ගුරුළුගෝමී පඬිවරයාගේ සාමර්ථ්‍යය **අමාවතුර** ඇසුරින් විමර්ශනය කරන්න.

3. **අමාවතුරේ** රචනා රීතිය නූතන විචාරකයන්ගේ පැසසුමට ලක්වීමට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න.

4. "සැදැහැවතුන් තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්තිය වර්ධනය කිරීම **පූජාවලිය** කතුවරයාගේ මුඛ්‍ය පරමාර්ථයක් විය." විමසන්න.

5. **සද්ධර්මාලංකාරය** ධර්ම ග්‍රන්ථයක් ලෙස හැඳින්වීම කොතෙක් දුරට යුක්ති යුක්තද? විමසන්න.

## III කොටස

6. "**සිදත් සඟරාවේ** ලිඟු අදියර ව්‍යාකරණ ලිංග ක්‍රමයේත් ජීවවිද්‍යාත්මක ලිංග ක්‍රමයේත් සංකලනයකි." විමසන්න.

7. **සිදත් සඟරාවේ** විබත් අදියරේ ඌනාධිකතා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

8. ව්‍යවහාර සිංහලයේ ක්‍රියා පදය හඳුනා ගැනීමට සිදත් සඟරාවේ කිරිය අදියරේ අඩංගු කරුණු කොතෙක් දුරට ඉවහල් වේ දැයි පරීක්ෂා කරන්න.

9. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

i රෝහලේ වෛද්‍යවරයෙකු නැත.
ii. ඥාති මිත්‍රාදීන් මේ කණගාටුදායක නිවේදනය පිළිගනිත්වා.
iii. ඩෙංගු උවදුර මර්ධනයට සහාය දැක්වීම සියළු පුරවැසියන්ගේම යුතුකමකි.
iv. සුදුසුකම් නැති පුද්ගලයෝ වෛද්‍ය උපාධිය හදාරතියි සරසවි ශිෂ්‍යයෝ මැසිවිලි නගති.
v. සිංහයෙක් රජකුමරියක් හා විවාහ විය.
vi. වර්ජනය නිසා කිසිවෙක් සේවයට පැමිණ නැත.
vii. ඔවුන් සතුටුව සාදු නාද දෙති.
viii. අප තවමත් ආගම හා විද්‍යාව අතර අතරමංව සිටින්නෙමු.
ix. බොහෝ දෙනෙක් මහළු වියට පැමිණි පසු ජීවිතයේ යතාර්ථය සෙවීමට පෙළඹෙති.
x. අයදුම්කරුවන් අතුරින් සුදුස්සන් පමණක් තෝරාගනු ලැබේ.

(2 සිට 9 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 15 බැගිනි.)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016 (අගෝස්තු 2017)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016 (AUGUST 2017)

## SINHALA III ( SLG 3 )
(කාව්‍ය විචාරය, පැරණි පද්‍ය සාහිත්‍යය හා සාහිත්‍ය වංශය)

කාලය පැය තුනයි (03).

**පළමු වන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. II, III කොටස්වලින් එක් ප්‍රශ්නයක් වත් තෝරාගත යුතු ය. නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).

---

### I කොටස

1. (අ) i. පහත දැක්වෙන පද්‍ය **ලිහිල් බසින්** ලියන්න.

නහන මෙහෙ නියුත් දෙනෙ අද සොයා විල්වත්
සඳ මග කැරැ විසිත් ගෙන මිටුසක් වියී මේ

සුරසිඳු කලුන් ලූ නුවන් පැහැනද වන් වූ
සුනිල් සිලිල් තෙලෙ තරඟ වැලිනොබොල
කොමල පවන්

පිළිබිඹු ලෙසින් වන් රිවි රජහට සත් දහස්
ලැගු සිරිසර විඳුනා විසිත් පියුමෙන් රඳනා

ගජමෙහි ගජමෙන් සිලිල් තල වෙරළ අතළේ
දුනු රුවනකුරුදහස් සිරි අළ තඹුරු කැකුළෙන්

ඉති සිරිසර විල් තරඟත වටා නටමින්
තඹරමියෙන් බමර ගී ත දක්න මෙනෙන් කියනෙව්

(**කව්සිළුමිණ**: ඇම්. බී. ආරියපාල සංස්: 499-503 ගී)

ii. කිසියම් අවස්ථාවක් සජීව ලෙස චිත්‍රණය කරනු පිණිස **කව්සිළුමිණ** කවියා අලංකාරෝක්ති භාවිත කළ ආකාරය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

(අනෙක් පිට බලන්න)

(ආ) i. පහත දැක්වෙන පද්‍යාවල අර්ථ **ලිහිල් බසින්** ලියන්න.

පියයුරු අඳුරු තුරු සළපටිනි වස මි නි
නිසකත එසඳ එත සියකර අකුළ මි නි
පරඳර වරද වරමින් වර ගුණ සිති නි
සියකුල සිරිත රිවි මුළු ලොවට පෑ වෙ නි

ද ව ස පු රා දිව මහදෙව් උදය'ට රා
අ ව ර' ඕ රා පත වරතර ගතින් ද රා
ස ර ත දු රා කැයි නහවනුව සමුදු රා
ස හ ස ක රා කර ඇදි වැන්න තම ක රා

(**මයූර සන්දේශය**: ඩබ්. එෆ්. ගුණවර්ධන සංස්කරණය: 96-97 පද්‍ය)

ii. **මයූර සන්දේශ කවියා**, ශබ්දාර්ථ මැනවින් සංකලනය කොට, කාව්‍යෝචිත භාෂා රටාවක් නිපදවාගෙන ඇති ආකාරය උක්ත පද්‍ය ද ඇසුරු කරමින් පෙන්වා දෙන්න.

(ඇ) i. පහත සඳහන් පද්‍යාවල අර්ථ **ලිහිල් බසින්** ලියන්න.

නො වළා'වරද තැන්
නො නැමී බසට මහතන්
විලසින් සිය සුතන්
සතන් රකිනු ය බලා ඇම තැන්

නො මකා කුල සිරිත්
නො තබා ම දෙන දත් වත්
නො වඩා අය බඳුත්
නැගු සිත් සේ ම දිය දිය කොත්

ගත උන් සබා මය
බස උන් ගේ සබා මය
ඉසුරින් සබා මය
සබා නම් උන් උන් සබා මය

අවා බිය ඇවුරු
සිත් සත් ගුණෙන් සපිරූ
දිගු බිත කිවියරූ
ඔවුන් ගුණ සිතුයමින් තැවරූ

රන් රූ සදිසියහ
දුක දුක නොයන රිසියහ
කන් කලු සුබැසියහ
ඔහු ම නර දෙව් නමට නිසියහ

(**බුදුගුණ අලංකාරය**: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු සංස්කරණය: 40-44 පද්‍ය)

(අනෙක් පිට බලන්න.)

ii. **බුදුගුණ අලංකාර** කතුවරයාගේ 'රාජ සංකල්පය' නූතන සමාජය සමඟ කෙතරම් බද්ධවන්නේදැ'යි ඉහත පද්‍යයන් ද ආශ්‍රය කරමින් පැහැදිලි කරන්න.

(පළමු වන ප්‍රශ්නයට උපරිමය ලකුණු 40යි)

## II කොටස

2. සංස්කෘත කාව්‍ය සම්ප්‍රදායට දේශීය මුහුණුවරක් දීමට දරන ලද ප්‍රයත්නයක් ලෙස **සියබස්ලකර** හැඳින්විය හැකිදැ'යි සනිදර්ශන ව විවරණය කරන්න.

3. "රසේ සාරඃ චමත්කාරඃ" යන කියමන කාව්‍යය සම්බන්ධයෙන් කෙතෙක් දුරට ගැළපේදැ'යි රසවාදය ද ඇසුරු කරමින් සමර්ථනය කරන්න.

4. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් සපයන්න.

   i. අලංකාර
   ii. රීති
   iii. අනුභාව
   iv. ව්‍යංග්‍යාර්ථ
   v. කාව්‍ය ගුණ

## III කොටස

5. "**කව්සිළුමිණ** රචනා වූයේ සාමාන්‍ය පාඨකයා වෙනුවෙන් නො ව, විදග්ධ රසිකයා අරමුණු කරගෙන ය" මේ පිළිබඳ ඔබේ මතය නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.

6. "අපූර්ව කාව්‍යෝක්තීන්ගෙන් සමලංකෘත වීම නිසා ම **මයූර සන්දේශය** පාඨක වින්දනය සියුම් කරයි."අභිමත වර්ණනා මගින් මේ සම්බන්ධ ඔබේ අදහස පැහැදිලි කරන්න.

7. "සරල බස් වහරත්, කෙටි විරිත් භාවිතයත්, සදය උපහාසයත් නිසා ම **බුදුගුණ අලංකාරය** පොදු පාඨකයා විසින් ළෙංගතුව වැලඳ ගනු ලැබී ය." මේ කියමන විමර්ශනය කරන්න.

8. "සිංහල සන්දේශ රචකයෝ හෙළ කවිය නව මාවතකට යොමු කළ ද බොදු බැතියෙන් නොමිඳුණහ." සම්භාව්‍ය සන්දේශ කාව්‍ය සමාශ්‍රය කරමින්, මේ පිළිබඳ ඔබේ මතය ඉදිරිපත් කරන්න.

(2 සිට 8 දක්වා පිළිතුරුවලට උපරිමය ලකුණු 20 බැගිනි.)